7 වන පිටුවෙන් (වත්මන් අර්බුදයේ )

කළ යුතුයයි කියනවා. තවත් සමහර ඇමතිවරු, මහඇමතිවරු පළාත් සභාවලට ඉඩම් හා පොලිස් බලතල ලබාදී 13 වැනිසංශෝධනය පූර්ණ ලෙස ක්‍රියාත්මක කළ යුතුයයි කියනවා. රාජපක්ෂ මහතාගේ ආණ්ඩුවේ කිසිදු වගකිව යුත්තකුට මෙවැනි ප්‍රකාශ කරන්න අයිතියක් නැහැ. ඔවුන් නියෝජනය කළ යුත්තේ, 2005 ජනවරම මිස තම තමන්ගේ පක්ෂවල හෝ පෞද්ගලික මත නොවෙයි. ජනාධිපති රාජපක්ෂ මහතා සිය ඇමතිවරුන්ට මෙවැනි ජනවරමට එරෙහි ප්‍රකාශ කරන්නට ඉඩදී නිකම් බලාගෙන ඉඳිමෙන් පෙනෙන්නේ, ඔහු ඒකීය රාජ්‍යය ආරක්ෂා කිරීම වෙනුවෙන් දෙගිඩියාවෙන් තොරව පෙනී නොසිටින බවයි.

ඊළඟට ජාතික ආර්ථිකය ගොඩ නැගීම ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීම, මාධ්‍ය නිදහස තහවුරු කිරීම, යහ පාලනය ස්ථාපිත කිරීම සහ තවත් ක්ෂේත්‍රවලදී ජනාධිපති රාජපක්ෂ මහතාත්, ඒ මහතාගේ ආණ්ඩුවත් සම්පූර්ණයෙන්ම අසාර්ථක වෙලා තිබෙනවා. ඒ මහතාගේපිහිටට ඇත්තේ ත්‍රිවිධ හමුදාවල හා පොලිසියේ වීරෝදාර සෙබළියන් හා සෙබළුන් ජීවිත පරිත්‍යාග කරමින් බෙදුම්වාදී ත්‍රස්තවාදයට එරෙහිව කරන යුද කටයුතු පමණයි. ඒ යුද කටයුතුවලදී ලබන ජයග්‍රහණ පමණයි. ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා මේ වන විට පැහැදිලි ලෙසම ආරක්ෂක හමුදා යුද පෙරමුණේ ලබන ජයග්‍රහණ බෙදුම්වාදයටත් ඉන්දියාවටත් පාවා දෙන්න අවශ්‍ය වාතාවරණය සකස් කරමින් ඉන්නවා. ඊළඟට ප්‍රජාතන්ත්‍ර විරෝධී ලෙස, සදාචාර විරෝධී ලෙස දිගටම බලයේ සිටීම සඳහා බල ව්‍යාපෘතියක් දියත් කර තිබෙනවා. ඥාති මිත්‍ර ගණයා අතට රටේ බලයත් රටේ ධනයත් කැටි කරමින් ඉන්නවා. මහින්ද රාජපක්ෂ ආණ්ඩුව දැන් පෙන්වන ලක්ෂණ අනුව මාකෝස් පන්නයේ" පාලනයක් වෙතගමන් කරමින් තිබෙන බව අපට පේනවා. මේ මොහොතේ එය දැකීමට අසමත් අයට එය ඉදිරියේදී තේරුම් ගැනීමට හැකිවේවි. පිලිපීනයේ මාකෝස් පාලන සමයේදීත් රටත්, ආර්ථිකයත් පාලනය කළේ, "පවුලේ" අය විසින්. ඒ වගේම විරුද්ධවාදීන් මර්දනය කළා. ඒත් ප්‍රජාතන්ත්‍රවාදය නමට තිබුණා. ඡන්ද මංකොල්ල කෑවා. ඒත් ඡන්ද පැවැත්වුවා. දැන් සිදුවෙන්නෙත් ඊට සමාන දේවල්. අපිම බලයට ගෙනා ජනාධිපතිවරයාගේ පාලනය ගැන මෙහෙම කියන්න සිදුවීම ගැන එක් අතකින් කණගාටුයි. ඒත් අපි ඇත්ත දකිය යුතුයි. ඒ තිත්ත ඇත්තට මුහුණ දිය යුතුයි. මේගොඩනැගෙන මාකෝස් පන්නයේ පාලනය පැරදවීමට කටයුතු කළ යුතුයි.

ප්‍රශ්නය :- දැන් එක්සත් ජාතික පක්ෂයත් ආණ්ඩුවට එරෙහිව නඟනවා. තමන්ට බලය ඉල්ලනවා. එක්සත් ජාතික පක්ෂයට යළි බලයට ඒමට හැකියාවක් තිබෙනවා යැයි සිතිය හැකිද?

ටිල්වින් සිල්වා සහෝදරයා : එක්සත් ජාතික පක්ෂයට යළි බලයට ඒමට හැකියාවක් ඇතැයිඅප සිතන්නේ නැහැ. ඒ වගේම ඔවුන්ට යළි බලයට ඒමට ඉඩ දිය යුතුත් නැහැ. අද මේ රටපත්ව තිබෙන විනාශයේ ආරම්භක වගඋත්තරකරුවන් ඔවුණුයි. මේ විනාශකාරී, කොල්ලකාරීවිවෘත ආර්ථික ප්‍රතිපත්තිය නිර්මාණය කළේ, ඔවුන්. රට බෙදන බෙදුම්වාදී ව්‍යාපාරය පෝෂණය කළේ, ඔවුන්. ලංකාව යළි-යටත්විජිතකරණය දෙසට ගෙනයාම ආරම්භ කළේ, ඔවුන්. ඒ වගේම විධායක ජනාධිපති ක්‍රමය හඳුන්වලදීලා ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදයට බරපතල හානි කළෙත් ඔවුන්. ඉතිහාසයේ ඔවුන් මේ රටටත්, ජනතාවටත් කළ ද්‍රෝහීකම් හා හතුරුකම් ප්‍රමාණය අතිවිශාලයි. ඔවුන්ට යළි බලය නොදිය යුත්තේ, ඒ නිසයි.

අනෙක් අතට අද එක්සත් ජාතික පක්ෂය බරපතල ලෙස දුර්වල වෙලා තියෙනවා. වික්‍රමසිංහ මහතාගේ නායකත්වයට එරෙහිව තිබූ අභ්‍යන්තර අරගලය දැන් ප්‍රසිද්ධ තලයට ඇවිල්ලා. ඒ වගේම එක්සත් ජාතික පක්ෂයේ ප්‍රබල නායකයින් 24ක් දැන් ඉන්නේ ආණ්ඩුවේ. රටට අලුත් මාවතක්, ප්‍රතිපත්තියක් ඉදිරිපත් කිරීමට ඔවුන්ට බැහැ. එක්සත් ජාතික පක්ෂය දැන් දේශපාලනමය වශයෙන් අභාවයට යමින් තිබෙන පක්ෂයක් ලෙසයි අපි දකින්නෙ. වර්තමානයේ එහි ඉන්නෙ බටහිරට අනුව හිතන හා වැඩ කරන නායකයින්. මේ ළඟදි එස්.බී. දිසානායක මහතා කිව්වේ කුමක්ද? ඔහු කිව්වෙත් රාජ්‍ය සම්පත්, ජාතික සම්පත් විකුණන්නේ නැතිව රටක් දියුණු කරන්න බැහැ කියලයි. මව්බිමේ අයිතිය ගැන කතා කිරීම මෝඩකමක් ලෙසත් හැඳින්වුවා. ඉතිං එලෙස හිතන නායකයින් ඉන්න පක්ෂයකින් අපේ රටටවැඩක් තියෙනවද? නැහැ. අද සිදුවිය යුත්තේ එක්සත් ජාතික පක්ෂය තුළ සිටින අවංක, රටටහිතැති අය ඉන් ඉවත්වීමයි. එය සිදුවන බව අපට පේනවා. ඒ නිසා යළිත් තට්ටු මාරු ක්‍රමයට එක්සත් ජාතික පක්ෂ පාලනයක් සඳහා ජනතාව කටයුතු කරාවි කියල අපි හිතන්නේනැහැ. ඔවුන්ගේ යුගය ඉවරයි.

ප්‍රශ්නයඃ- වර්තමානයේ ශ්‍රී ලංකාව මුහුණ දී සිටින සමාජ, ආර්ථික, දේශපාලන අර්බුදයට ඔබ ඉදිරිපත් කරන විසඳුම කුමක්ද?

ටිල්වින් සිල්වා සහෝදරයාඃ වර්තමානයේ අපේ රටේ පවතින්නේ, ඉතාම බරපතල සමාජ, ආර්ථික, දේශපාලන අර්බුදයක් බව ඇත්ත. ඊට නිවැරදි විවාදාත්මක පිළිතුරු සොයන ඕනෑම සංවිධානයක් මේ ප්‍රශ්න දෙස මතු පිටින් නොබලා ඒවා බිහිවීමට හේතුපාදක වූ කරුණු සොයාගත යුතු වෙනවා. අපි දකින විදිහට ශ්‍රී ලංකාව පසුගාමී ධනේෂ්වර සංවර්ධනයක් සහිත රටක්. අපි ස්වභාවික හා මානව සම්පත් අතින් හුඟක් පොහොසත් රටක්. ඒත් අපි ආර්ථික වශයෙන් දුප්පත් වී තිබෙනවා. ඊට හේතුව අපි තවමත් සැබෑ ජාතික නිදහස දිනාගෙන නොතිබීමයි. අපේ රටේ වත්මන් අර්බුදයේ හේතු ආරම්භ වෙන්නෙ තරමක් ඈත අතීතයේ සිට. අපි 1815 සිට වසර 133ක් බ්‍රිතාන්‍යයන්ගේ යටත්විජිතයක් ලෙස අධිරාජ්‍යවාදයට යටත්ව පැවැතුණා. සූරාකෑමට ලක්වුණා. වර්තමානයේ තිබෙන බොහෝ සමාජ ආර්ථික ගැටලු පටන් ගත්තේ එම පාලනය තුළයි. ඉන්පසු 1948 සිට 1970 දශකයේ අග දක්වා අපි නව යටත්විජිත උපක්‍රමය තුළ සිරවෙලා සිටියා. අපේ රටේ පාලකයෝ දේශීය වුණාට සියලු දේශපාලන ආර්ථික ප්‍රතිපත්ති නිර්මාණය කළේ, අධිරාජ්‍යවාදී බලවේග.ඉන්පසු අපේ රට යළි- යටත්විජිතකරණ ක්‍රියාවලියට ගොදුරු වුණා. දැන් අපේ රට පවතින්නේ, ඒ තුළ. මේ මුළු කාලය පුරාම (වසර 60ක්) අපේ රට පාලනය කරපු පාලකයින් කළේ කුමන හෝ අධිරාජ්‍යවාදී බලවේගයක ඒජන්තයෙක් ලෙස කටයුතු කිරීමයි. වත්මන් පාලනයත් එහෙමයි. ඒ නිසා වර්තමානයේ අපේ රට ඉදිරියේ තිබෙන ලොකුම අභියෝගය සැබෑ ජාතික නිදහස දිනා ගැනීමයි.

සැබෑ ජාතික නිදහස දිනාගනිමින් නව සමාජ, ආර්ථික පරිවර්තනයක් අපේ රටේ ඇති කළ යුතු වෙනවා. මෙය කාර්යයන් දෙකක් නෙවෙයි එකක්. එහිදී දැනට පවතින කොල්ලකාරී විවෘත ආර්ථිකය වෙනුවට ශක්තිමත් ජාතික ආර්ථිකයක් හෙවත් නිෂ්පාදන ආර්ථිකයක් ගොඩනැගිය යුතු වෙනවා. මේ මොහොත වනවිට ආණ්ඩුවේ ආර්ථිකය රඳා පවතින්නේ, දේශීය විදේශීය ණය මත හා ජනතාව මත පටවන බදු මතයි. 2008 පෙබරවාරි වනවිට අපේ රටේ සමස්ත රාජ්‍ය ණය ප්‍රමාණය රුපියල් කෝටි 317,850ක් තරම් විශාල එකක්. ඒ අනුව හැම පුරවැසියෙක්ම රුපියල් 160,000කට වැඩි ණයකාරයෙක් වෙලා. අනෙක් අතට ආණ්ඩුව ජනතාව මත බදු පිට බදු පනවනවා. බඩුමිල මේ තරම් ඉහළ යන්නෙ ඒ නිසා.

මහ බැංකු වාර්තාවලට අනුව පසුගිය අයවැයේ සිට 2008 පෙබරවාරි වනවිට එකතු කරගෙන තිබෙන ලංකාවේ රාජ්‍ය ආදායම රුපියල් බිලියන 102.9ක්. ඉන් රුපියල් බිලියන 97.5ක් ම බදු ආදායම්. බදු නොවන ආදායම් තිබෙන්නෙ රුපියල් බිලියන 5.3ක් තරම් සුළු ප්‍රමාණයක්. ඉතිං මේ ණය හා බදු මත යැපෙන ආර්ථික රටාව වෙනස් කළ යුතුයි. ඒ වෙනුවට ශක්තිමත් ජාතික ආර්ථිකයක් නිර්මාණය කළ යුතුයි. රටේ සියලු නිෂ්පාදන ශක්තීන් එක්රැස් කර ජාතික වුවමනාවන්ට ප්‍රමුඛතාවය දෙමින් එහෙත් ලොව දියුණුම තාක්ෂණය, දැනුම හා සාධාරණ එකඟතා මත විදේශ ආයෝජන යොදාගනිමින් ආර්ථිකය සංවර්ධනය කළ යුතු වෙනවා. එම ආර්ථික සංවර්ධනයේ ප්‍රතිලාභ පවුල් කිහිපයක් අතට නොව සමස්ත සමාජයටම සාධාරණ ලෙස බෙදීයන ක්‍රමයක් සකස් කළ යුතු වෙනවා. ඒ වගේම අනෙක් අතට බෙදුම්වාදය සැබෑ ලෙසම පරදවමින්, ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කරමින්, ආර්ථික සංවර්ධනය ඇති කොට සියලු ජනයාට සමාන අවස්ථා ලබාදෙමින්, ජාතිකසමඟිය ගොඩනගා ජාතික ගැටලුව විසඳිය යුතු වෙනවා. රට තුළ සැබෑ ප්‍රජාතන්ත්‍රවාදය හා යහ පාලනය ස්ථාපිත කළ යුතු වෙනවා. මෙය ජාතික නිදහස දිනා ගැනීමත් සමඟ සම්බන්ධ වන සමාජ පරිවර්තනයක් තුළින් ඉටුකරගත යුතු කාර්යයක් ලෙසයි අපි දකින්නේ.ඒ සඳහා පළල්තම දේශප්‍රේමී හා ප්‍රගතිශීලී බලවේගයන්ගේ ආණ්ඩුවක් පිහිටුවිය යුතු ද වෙනවා.

